UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

## විශේෂඥ වෛද්‍ය නිලධාරි - පූර්ණ කාලීන ස්ථිර පදනම මත

1. හෘද උරස් විශේෂඥ ශල්‍ය වෛද්‍ය (පුරප්පාඩු 01)
2. හෘද සැත්කම් පිළිබඳ නිර්වින්දන විශේෂඥ වෛද්‍ය (පුරප්පාඩු 01)
3. හදිසි අනතුරු විශේෂඥ වෛද්‍ය (පුරප්පාඩු 01)
4. විකිරණවේදී විශේෂඥ වෛද්‍ය (පුරප්පාඩු 02)
5. පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය (පුරප්පාඩු 01)
6. රසායනික රෝග විද්‍යා විශේෂඥ වෛද්‍ය (පුරප්පාඩු 01)
7. රක්තව්‍යාධි විද්‍යා විශේෂඥ වෛද්‍ය (පුරප්පාඩු 01)

**සුදුසුකම්:**

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධරයෙකු වීම.

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධරයෙකු වීම.

සහ

III. විශේෂඥ වෛද්‍ය (MD/MS) උපාධිය සමඟ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ I වන පරිශිෂ්ටය).

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MC 1-2 පියවර 14 - රු.(161,140 - 12 × 4,850 - 219,340)
(මෙම MC 1-2 වැටුප් තලයේ මූලික වැටුප් පියවරෙහි ඔබ තබනු ලැබේ.)

**පොදු කොන්දේසි**

සෑම අයදුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සෑම අපේක්ෂක/ අපේක්ෂිකාවක්ම ජෙනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම් කරනු ලබන තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5. සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෙගුලාසිවලට අනුකූලව සියලු වැටුප් හා දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

6. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා නියුක්තිකයාගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරණ අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරණු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව.)

7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2026.05.31** දිනට පෙර **"විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"** යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

8. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

9. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී යොමු කරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.www.kdu.ac.lk / දුරකථන අංකය – 011 204 4555.

**www.kdu.ac.lk**